13

# අන් අයගේ දෑ ඔවුන්ගේ අවසරය පිට භාවිත කිරීම

يَاَيُّهَا الَّذِيْنَ اٰمَنُوْا لَا تَدْخُلُوْا بُيُوْتًا غَيْرَ بُيُوْتِكُمْ حَتّٰى تَسْتَاْنِسُوْا وَتُسَلِّمُوْا
عَلٰٓى اَهْلِهَا ذٰ لِكُمْ خَيْرٌ لَّكُمْ لَعَلَّكُمْ تَذَكَّرُوْنَ

**"විශ්වාසවන්තයිනි! ඔබගේ නිවෙස් හැර (අන්) නිවාසවලට එහි (නිවසෙහි) ඇත්තන්ගේ අවසරය ඇති ව, නිවැසියන්ට සලාම් නොපවසන තෙක් (එතුළට) ඇතුළු නොවන්න. (එසේ හැසිරීම) ඔබලාට යහපතක් ම වේ. ඔබලා යහ උපදේශය ලැබීමට (මෙය ඔබලාට පවසනු ලබයි)"** (24:27)

සයියාබ් ආමීර් යන දෙදෙනා අඹ යහළුවෝ ය. ඔවුහු දෙදෙනා ම නොවරදවා ම පාසල් යති. පන්ති කාමර කටයුතුවල දී මොවුහු දෙදෙනා ම ඉදිරියෙන් සිටිති. සයියාබ් තම පියාගේ අසනීපය නිසා උපකාර කිරීම පිණිස එදින පාසලට නො ගොස් සිටියේ ය. තම මිතුරා පාසලට නොපැමිණීම ආමීර්ට ගැටලුවක් වූයේ ය. මවට කරුණු කී ආමීර් සයියාබ්ගේ ගෙදරට ගියේ ය. නිවසේ දොර තරමක් ඇර තිබුණි. ආමීර් නිවසට එක් වර ම ඇතුළු නොවී පැත්තකට වී සිට ඇතුළට ඇහෙන සේ සලාම් තුන් වරක් ම කීවේ ය. පිළිතුරක් නොලැබුණු අතර කිසිවෙකු පිටතට නොපැමිණි බැවින් ඔහු ආපසු යන්නට සූදානම් වූයේ ය. එවිට නිවස තුළින් හඬක් ඇසුණි.

**සයියාබ්:** අස්සලාමු අලයිකුම්. ආමීර් ඇයි ගේ ළඟට ඇවිල්ලත් ඇතුළට නැවිත් ආපහු යන්නේ ?

**ආමීර්:** ව අලයිකුම් සලාම්, ඔබට සලාම් කිව්වා. පිළිතුරක් නැති නිසා ආපහු යන්න හැරුණා.

**සයියාබ්:** මේ අලුත් කතාවක්නේ ? වෙන දා අපේ ගෙදර ආවා ම සලාම් කියාගෙන ගෙට ඇතුළු වෙනවා නේද? එසේ ම එන්න තිබුණා නේ ?

ආමීර්: සයියාබ්! අද ඉස්ලාම් පාඩමේ දී මම මේ පිළිවෙත ඉගෙන ගත්තා. අන් අයගේ නිවසකට ගියා ම අප අනිවාර්යයෙන් ම තෙවරක් සලාම් කියා ඇතුළුවීමට අවසර පැතිය යුතු යි. අවසර නොලැබුණා ම ආපහු යා යුතු යි. යැයි ගුරුතුමා කියා දුන්නා. ඒ පිළිවෙත තමා මම දැන් ක්‍රියාත්මක කළේ. අපි යමක් ඉගෙන ගත්තා නම් එය ක්‍රියාත්මක කළ යුතු යි. එසේ නොකිරීම පාපයක් නේද?

සයියාබ්: ඔව්! ඔබ හොඳ දෙයක් මටත් කියා දුන්නා.

ආමීර්: ඔබ ඇයි අද පාසලට නාවේ? ඒක දැන ගන්න ආවේ.

සයියාබ්: අද උදේ හදිස්සියේ ම තාත්තාට අසනීප වුණා. තාත්තා එක්ක රෝහලට ගියා දැන් ටිකක් හොඳයි. අල්හම්දුලිල්ලාහ්!

ආමීර්: ඔබගේ පියාට අල්ලාහ් හොඳ ශරීර සෞඛ්‍ය ලබා දෙත්වා!

සයියාබ්: ඔබ ආපු එක මට සතුටක්. අද ඉස්ලාම් පාඩමේ දී තව මොනවා ද ඉගෙන ගත්තේ?

ආමීර්: අනික් අයගේ බඩු බාහිරාදිය ඒ අයගේ අවසරයක් නැති ව භාවිත නොකළ යුතු යි කියා ඉගෙන ගත්තා. අන් අයගේ නිවසට ඇතුළුවන විට ඔවුන්ගේ අවසරය ලබා ඇතුළුවීම, ආදිය පිළිබඳ ව ඉගෙන ගත්තා. අපේ එදිනෙදා ජීවිතයේ අප නොදැනුවත් ව සිදුවන මේ වගේ වැරදි අඩුපාඩුකම් ගැන කියලා දුන්නා.

සයියාබ්: අනික් අයගේ බඩු බාහිරාදිය පාවිච්චි කරන්න ඒ අයගේ අවසරය හැම විට ම ලබා ගන්න ඕනෑ ද?

ආමීර්: අපේ ගෙදර, පාසල, පන්ති කාමරය වගේ කොහේ සිටියත් අපි අනික් අයගේ බඩු බාහිරාදිය ඒ අයගේ අවසරය ඇතිවයි පාවිච්චි කරන්න ඕනෑ. එහෙම අවසර නැති ව භාවිත කිරීම හරාම්. අපි අනවසරයෙන් අන් අයගේ ද්‍රව්‍ය භාවිත කරන කොට විවිධ අයහපත් ප්‍රතිඵල ඇතිවෙන්නට පුළුවනි. සමහර අවස්ථාවල මිතුරන් හා නෑදෑයින් අතර විරෝධය ද ඇති



වෙන්න පුළුවනි. අන් අයගේ ද්‍රව්‍ය භාවිත කරන විට, ඉස්ලාම් ඉතා පරිස්සමින් කටයුතු කළ යුතු බව ද, සඳහන් වන බව ගුරුතුමා සාධක සහිත ව පැහැදිලි කළා.

**සයියාබ්:** ඔව්! පසුගිය සතියේ අපේ හවස පන්තියේ දී ඒ වගේ සිද්ධියක් සිදුවුණා. රලීන්ගේ පෑන ඔහුගේ අවසරය නැති ව ගත් වසීම් ඒක අල්ලපු පන්තියේ රිෆාන්ට දුන්නා. ඒත් ඒකට ඔහු අවසර ගත්තෙත් නෑ. රිෆාන්ට ඒ ගැන කිසිවක් කිවුවෙත් නැහැ. ඒ හින්දා රලීන් තරහ වී ගුරුතුමාට පැමිණිලි කළා. ගුරුතුමා ඒ ගැන විමසා ප්‍රසිද්ධියේ ප්‍රශ්න කරන විට, පන්තියේ ඉගැන්වීම් කටයුතු වලට බාධා වුණා. ඒ අතර ගජ මිතුරන් වූ රලීන් හා වසීම් කතා බහ කිරීම ද නතර කළා

**ආමීර්:** ඉස්ලාම් ගුරුතුමා ද පන්ති පරිසරය හා නිවෙස් පරිසරය ආදියේ සිදුවන මෙවැනි සිද්ධීන් රැසක් පෙන්වා දුන්නා. අවසරය නොමැති ව අයකුගේ ද්‍රව්‍ය ගැනීම නිසා ක්‍රෝධය වැඩිවෙනවා. අයකු අන් අය කෙරෙහි සැක කරයි නම් ඔවුන් අතර බැඳීම දුරස් වෙනවා. නොසන්සුන් තත්ත්වයක් හා කලබලකාරී පරිසරයක් බිහි වෙනවා. එම නිසා ඉතා කුඩා දෙයක් වුවත් අදාළ අයගේ අවසරය ඇතුව ලබා ගත යුතුයි. හදිසි අවස්ථාවක

දී අවසරයක් ලබා ගැනීමට නොහැකි වූ විටක, පසුව ඔහුට දැනුම් දීමට ඉදිරිපත් විය යුතුයි. එහෙම කරන්නේ නැත්නම් එය හොරකම් කිරීමකට සමාන වෙනවා කියා ගුරුතුමා කියා දුන්නා.

**සයියාබ්:** අපගේ කිට්ටු නෑයන් හා මිතුරන්ගේ නිවෙස්වලට යන විටත් ඇතුළුවීමට අවසර ගන්න ඕනෑ ද?

**ආමීර්:** අපි කාගේ නිවසට ගියත් සලාම් කියා අවසරය ලබා ගන්න ඕනෑ. තුන් වරක් අවසර ඉල්ලූ විට දී ත් අවසරය ලැබුණේ නැතිනම් ආපසු හැරිය යුතු බවයි ඉස්ලාම් අපට කියා දී තිබෙන්නේ.

**සයියාබ්:** ගුරුතුමා මෙයට කිසි යම් ඓතිහාසික සාධක ඉදිරිපත් කළා ද?

**ආමීර්:** ඔව්, අල් කුර්ආනයෙන් හා නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාගේ ජීවිතයෙනුත් ලස්සන උදාහරණ ඉදිරිපත් කළා.

''විශ්වාසවන්තයිනි! ඔබට ඔබගේ නොවන වෙනත් නිවෙස්වලට ඇතුළුවීමට අවශ්‍යතාවක් ඇති වූවා නම්, එම ගෙවල්වල සිටින අයගෙන් ඔබ තුන්වතාවක් අවසර ඉල්ලා එම නිවෙස්වල සිටින අයට, සලාම් පවසන තෙක් (ඒවාට) ඇතුළු නොවන්න (24:27)

''අල්ලාහ්ගේ දූතයාණන්, සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා ඔබගෙන් අයකු තෙවරක් අවසර ඉල්ලා ඔහුට අවසර නොලැබුණු විට ඔහු ආපහු හැරුණදෙන්'' යැයි පවසා ඇත. (බුහාරි)

**සයියාබ්:** අප යම් දෙයක් පාරේ හෝ පොදු ස්ථානයකින් අහුලා ගත් විට එය අනවසරයෙන් භාවිත කළ හැකි ද? මෙයට ගුරුතුමා පැහැදිලි කිරීමක් කළා ද?

**ආමීර්:** මේ පිළිබඳ ව හොඳ පහදා දීමක් ගුරුතුමා ලබා දුන්නා අප පොදු ස්ථානයකින් හෝ මහපාරේ තිබී යමක් ඇහින්ද නම් එය එතැන ම අතහැර එන්න ඕනෑ. නැතහොත් අයිතිකරු සොයා බාර දෙන්න ඕනෑ.

**සයියාබ්:** ජසාකල්ලාහු හයිරන්! ආමීර් ආ හින්දා මම ගොඩක් කරුණු දැන ගත්තා. අපි ඉගෙන ගත්ත කරුණු අපගේ ජීවිතයේ දී අනුගමනය කර ආනිශංස ලබමු. ඉන්ෂා අල්ලාහ්!

## අභ්‍යාස

1. අපට අයත් නොවන යමක් භාවිත කිරීමට සිදු වූවා නම් අප කුමන ක්‍රම අනුගමනය කළ යුතු ද යන්න කෙටියෙන් පවසන්න.
2. අන් අයගේ බඩු බාහිරාදිය අවසර නොමැති ව භාවිත කිරීම නිසා ඇතිවන විපාක ලැයිස්තු ගත කරන්න.
3. පොදු ස්ථානවලින් සොයා ගන්නා දේවලට කුමක් කළ යුතුදැයි කෙටියෙන් ලියන්න.
4. අන් අයගේ නිවෙස්වලට ඇතුළු වීමට පෙර අප අනුගමනය කළ යුතු පිළිවෙත් පිළිවෙළින් ලියන්න.